(12)

01068

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
ස්වභාවික විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව (2016/2017)
අවසාන පරීක්ෂණය – තෙවන මට්ටම (දෙවන අර්ධවාර්ෂිකය)
**SSU 1198- ශ්‍රී ලංකාවේ සමාජය පිළිබඳ හැඳින්වීමක්**

කාලය පැය දෙකයි (02).

දිනය 2017. 07. 25 වේලාව පෙ.ව 9.30 - පෙ.ව 11.30

ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 25ක් බැගින් හිමිවේ.

1. මෙරට උපත ලබා හැදී වැඩුණු සාමාජිකයන් ලෙස මෙරට සමාජ සංස්කෘතික වටපිටාව පිළිබඳව අපට මනා අවබෝධයක් තිබේ. එවැනි පසුබිමක් තුළ මෙරට සමාජය හා සංස්කෘතිය අවබෝධකර ගැනීමට විශේෂ පාඨමාලාවක් හැදෑරිය යුතුද? සාකච්ඡා කරන්න.

2. ධරණීය සංවර්ධන දර්ශක ළඟා කර ගැනීම සඳහා රට පෙරට ගෙන යෑමට පාර්ලිමේන්තු පාලන ක්‍රමය කොතරම් දුරකට උපකාරී වේද? විවාදයට බඳුන් කරන්න.

3. යහපාලන ප්‍රතිපත්තිය හා නීතියේ ආධිපත්‍ය නැති කිරීම පෙරටුකරගෙන බලයට පැමිණි වර්තමාන රජය පිළිබඳව සළකා බලමින් විධායක ජනාධිපති ක්‍රමයේ වාසි හා අවාසි මොනවාදැයි විග්‍රහ කරන්න.

4. ලංකාව බහු ආගමික හා බහු සංස්කෘතික රටක් ලෙස අපි නිර්වචනය කරන්නේ ඇයි? තර්ක කරන්න.

5. සිංහල හා හින්දු ඥාතීත්ව ක්‍රමයන් වල තිබෙන සමානතාවයන් හා අසමානතාවයන් සංසන්දනය කරන්න.

6. සමාජය තුළ පිරිමින් හා කාන්තාවන් වෙනස්කොට අගය කිරීමක් සිදුවේද? එවැනි වෙනස් කොට සැළකීමක් අපට අනුමත කළ හැකිද?

7. රටක ආර්ථික ප්‍රතිපත්ති හා පන්ති නිර්මාණය අතර තිබෙන සබඳතාවය කුමක්ද? විස්තර කරන්න.

8. නගරවල අපද්‍රව්‍ය ගොඩ නැගීම ලංකාවේ සමජ හා ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵලයක්ද? විග්‍රහාත්මකව සාකච්ඡා කරන්න.

9. පහත සඳහන් මාතෘකා අතරින් තෝරාගත් පහක් (05) පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   i. ලංකාව තුළ තිබෙන ආගමික ආතතිය
   ii. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය හා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම
   iii. සමාජ චලතාවය පිළිබඳ අදාළ වන පාරම්පරික හා නූතන නිර්ණායකයන්
   iv. ලාංකේය සමාජය තුළ වෙනස්වන අගයන් හා ධර්මතා
   v. එදිනෙදා ජීවිතයේ සමාජ ප්‍රශ්න විසඳීම සඳහා සමාජ විද්‍යාවන් හා ස්වභාවික විද්‍යාවන් වල සහයෝගීතාවය
   vi. ස්වභාවික ආපදාවන් හා ආපදාවන්ට ලක්වූවන් සඳහා උපකාර කිරීමේදී මිනිසුන්ගේ සහයෝගීතාවය
   vii. දශක තුනකට ආසන්න ජනවාර්ගික යුද්ධයෙන් පසු ලංකාව නැවත ගොඩනැගීමේදී මතුවන බාධාවන්

****** සියලුම හිමිකම් ඇවිරිණි******